ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය - 2017

---

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2003 අංක 01 දරන ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතන නියමාවලියේ 17 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය සමග සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ඉල්ලුම් තැන්පතු ආයෝජන වෙනුවෙන් ලැබූ රු.363,466 ක පොලී මුදල ආදායමට බැර කිරීම වෙනුවට ඉල්ලුම් තැන්පතු ගිණුමට බැර කිරීම හේතුවෙන් වර්ෂය අවසානයේ ඉල්ලුම් තැන්පතු ආයෝජන ගිණුමේ ශේෂය හා පොලී ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වටිනාකම රු.18,000,000 ක් වූ ස්ථාවර තැන්පතු 08 කට සහ වටිනාකම රු.10,000,000 ක් වූ කාලීන තැන්පතු 02 කට අදාළව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු එකතුව රු.599,295 ක පොලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව මුදලින් ලැබී තිබූ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.4,591,309 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ලාභයෙන් අඩුකර ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස දක්වා නොතිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 11වන කොටසෙහි 15(V) උපවගන්තිය | උසස් අධ්‍යාපන ආයතනයන් විසින් පැවැත්විය යුතු පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලබාගත යුතු වුවත්, ආයතනය විසින් දැනට පවත්වාගෙන යනු ලබන අණුක ජෛව විද්‍යා විද්‍යාපති උපාධි පාඨමාලාව සහ සෙල සහ |

| | |
|---|---|
| | අණුක ප්‍රතිශක්තිවේද විද්‍යාපති උපාධි පාඨමාලාව සඳහා එපරිදි අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 (2) හා 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අත්තිකාරම් ලබාගත් කාර්යය නිම කළ විගසම අත්තිකාරම පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ සැපයුම් හා සේවා කටයුතු සඳහා අවස්ථා 32 කදී ලබාදී තිබූ එකතු වටිනාකම රු.1,126,815 ක අත්තිකාරම් පියවීම සඳහා දින 32 සිට දින 300 ක් දක්වා කාලයක් ගතවී තිබුණි. |
| (ඇ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 06 දෙනෙකුගේ පැමිණීම සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.15,086,947 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.5,602,236 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.15,130,687 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.20,732,923 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පුද්ගලික පඩිනඩි වියදම රු.6,185,876 කින් වැඩිවීම සහ සැපයුම් වියදම රු.12,837,418 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාම අතිරික්තයක් පැවති අතර 2017 වර්ෂයේ ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සහ රජයට ගෙවූ බදු නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ රු.36,348,650 ක් වූ ආයතනයේ දායකය අඛණ්ඩව වර්ධනය වී 2016 වර්ෂයේදී රු.58,912,625 ක් වුවද 2017 වර්ෂයේදී රු.48,258,013 ක් ලෙස 2016 වර්ෂයට සාපේක්ෂව සියයට 20 කින් අඩු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පාඨමාලා 3 ක් සඳහා සිසුන් 45 දෙනෙක් බඳවා ගැනීමට ඉලක්ක කළද බඳවාගෙන තිබුණේ පාඨමාලා 2 ක් සඳහා සිසුන් 11 දෙනෙකු පමණි. ජෛව තොරතුරුවේද විද්‍යාපති උපාධි පාඨමාලාව නොපැවැත්වීම සහ සෛල හා අණුක ප්‍රතිශක්තිවේද විද්‍යාපති උපාධි පාඨමාලාවේ පාඨමාලා ගාස්තු රු.500,000 සිට රු.600,000

දක්වා වැඩි කිරීම ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වීමට හේතු වී ඇති බව අධ්‍යක්ෂවරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි නව පශ්චාත් උපාධි පාඨමාලා තුනක් ආරම්භ කිරීම සඳහා සැලසුම් කර තිබුණද 2017 වර්ෂයේදී කිසිදු නව උපාධි පාඨමාලාවක් ආරම්භ කර නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2007 ඔක්තෝබර් 11 දිනැති 39 වන කළමනාකරණ මණ්ඩල රැස්වීම් තීරණය පරිදි ආයතනයේ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමේ අරමුණින් ආයතනික සංවර්ධන අරමුදල පිහිටුවා තිබූ අතර සියලුම පාඨමාලා ආදායමෙන් සියයට 10 ක මුදලක් මෙම අරමුදලට මාරු කළ යුතු බව එහි දක්වා තිබුණි. එසේ වුවද, 2017 වර්ෂයේ මෙම අරමුදල සඳහා කිසිදු මුදලක් මාරුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාලව පාඨමාලා අයවැය සකස් කිරීමේදී හෝ මේ පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට එම ගිණුමේ ශේෂය රු.5,929,055 ක් විය.

(ආ) 2012 වර්ෂයෙන් පසු සිසුන් බඳවා ගෙන නොතිබුණු ජෛව තොරතුරුවේද උපාධි පාඨමාලාවේ විෂය අන්තර්ගතය පිළිබඳ 2015 වර්ෂයේදී සමාලෝචනයක් සිදුකර පාඨමාලාව සඳහා යෝජිත නීති කෙටුම්පත් 2018 ජනවාරි 03 දින අධ්‍යයන මණ්ඩල වෙත ඉදිරිපත් කර තිබුණ ද පාඨමාලාව නැවත ආරම්භ කළ හැකි කාල සීමාව තීරණය කර නොතිබුණි. ඒ හේතුවෙන් වසර 05 කටත් වැඩි කාලයක් පවත්වා නොතිබුණු මෙම පාඨමාලාව හැදෑරීමට අපේක්ෂිත සිසුන්ට ඒ වෙනුවෙන් තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

**4.3 අරමුදල් උපයෝජනය**

-------------------------

ආයතනය සතුව පවතින ආයතනික සංවර්ධන අරමුදල (Institute Development Fund), පරිත්‍යාග අරමුදල (Endowment Fund) සහ වත්කම් ප්‍රතිසම්පාදන අරමුදල (Asset Replace Fund) යන ආයතනය සතුව පවතින අරමුදල් තුනෙහි 2017 දෙසැම්බර් 31 දිනට රු.22,074,607 ක ශේෂයක් පැවති අතර සමාලෝචිත වර්ෂය තුල මෙම අරමුදල් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කර නොතිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

----------------------

**5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම**

-------------------------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක්ම විසින්ම කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------

### 6.1 ප්‍රසම්පාදනය

----------------

පිරිවැය රු.4,000,000 ක් වූ Elisa Plate Reader යන්ත්‍රය මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදය පරිදි ජාතික වශයෙන් තරඟකාරී ලංසු කැඳවීමේදී අවම කාලසීමාව දින 21 ක් වුවද රු.4,000,000 ක් වටිනා Elisa Plate Reader යන්ත්‍රය මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීමේ කාලසීමාව දින 10 ක් ලෙස සීමා කර තිබීමෙන් සුදුසුකම් ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීම සඳහා සාධාරණ හා උපරිම අවස්ථාව ලබාදී නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) මෙම යන්ත්‍රය මිලදීගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 හා 5.4.8 මාර්ගෝපදේශ ප්‍රකාරව ගිවිසුමකට එළඹ නොතිබූ අතර 2017 අගෝස්තු 29 දිනැති අංක 2017/08/15 මිලදී ගැනුම් ඇණවුම නිකුත් කරන අවස්ථාවේ කාර්යසාධන සුරක්ෂණය ඉදිරිපත් කර නොතිබුණි. ආයතනය විසින් සිදුකරන ලද දැනුම්දීමකින් අනතුරුව 2017 නොවැම්බර් 27 දින එනම් මාස 3 ½ ක ප්‍රමාදයකින් පසු කාර්යසාධන සුරක්ෂණය ඉදිරිපත් කර තිබුණි.

(ඇ) ඇණවුම භාරදී සති 06 ත් සති 08 ත් අතර කාලය තුළ මෙම යන්ත්‍රය සැපයීමට සැපයුම්කරු එකඟ වී තිබුණද 2018 අප්‍රේල් 09 වන දින සති 23 ක ප්‍රමාදයකින් පසු යන්ත්‍රය ආයතනය වෙත ගෙනවිත් භාරදී තිබුණි. ඇණවුමේ සඳහන් පරිදි මේ සඳහා රු.400,000 ක ප්‍රමාද ගාස්තුවක් සැපයුම්කරුගෙන් අයකරගත යුතු වුවද එසේ අයකරගෙන නොතිබුණි.

### 6.2 අභ්‍යන්තර විගණනය

---------------------------

කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් ආයතනයේ අභ්‍යන්තර විගණනය සිදුකර තිබුණි. 2017 වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව 2017 වර්ෂය තුළ ආයතනයේ විෂයයන් 13 ක් විගණනය සඳහා සැලසුම් කර තිබුණද ඉන් එක් විෂයයක් වන වාහන භාවිතය පිළිබඳව පමණක් එක් විගණන විමසුමක් නිකුත් කර තිබුණි. මේ අනුව ආයතනයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය.

### 6.3 අයවැය පාලනය

-----------------

අයවැයගත සංඛ්‍යා තත්‍ය තොරතුරු සමඟ සැසඳීමේදී, භාණ්ඩ සැපයුම් වෙනුවෙන් දරන ලද වියදම සියයට 112 කින් හා නඩත්තු කාර්යයන් වෙනුවෙන් දරන ලද වියදම් සියයට 106 කින් විචලනය වී තිබුණි.

### 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

වැයකළ ප්‍රාග්ධන ප්‍රදාන සඳහා ලෙජර් ගිණුම් 04 ක් පවත්වාගෙන ගොස් තිබුණු අතර ඉන් ලෙජර් ගිණුම් දෙකක රු.1,912,598 ක හා රු.79,234 ක හර ශේෂයන් දක්නට ලැබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂකවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | අයවැය පාලනය | අයවැය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා නොගැනීම. |
| (ආ) | අරමුදල් පාලනය | අරමුදල්, අපේක්ෂිත පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා යොදා නොගැනීම. |
| (ඇ) | ප්‍රසම්පාදනය | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ කෙරෙහි අවධානය යොමු නොකිරීම, ප්‍රසම්පාදනයන් නිශ්චිත දින වකවානු තුළ අවසන් කර නොතිබීම. |
| (ඈ) | පාඨමාලා පවත්වාගෙන යාම | ශිෂ්‍ය බඳවාගැනීම අඩුවීම හා පාඨමාලා ආදායම අඩුවීම. |